# බුදුන් වදාළ දුක්ඛ සත්‍යය



රොක් බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරවාසී, ත්‍රිපිටකවේදී පූජ්‍ය
**තිත්තගෝනෑවේ සරණංකර හිමි.**



බුහු දහම තුල ඇති වැදගත්ම ඉගැන්වීම, චතුරාර්ය සත්‍ය ධර්මයයි. එම දේශනාව තුළින් අපට අපේ බුදුහාමුදුරුවෝ ජීවමානව දකින්න පුළුවනි. බුදුරජාණන් වහන්සේ පුරා 45 වසරක් දේශනා කළ වදාළ 84,000 දාහක් ධර්මස්කන්ධය මෙම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයට අන්තර්ගතය.

මෙම චතුරාර්ය සත්‍ය ධර්මය තුළින් ප්‍රධාන කොටස් හතරක් පෙන්වා දෙනවා. එයින් දුක්ඛ සත්‍යය ප්‍රධානයි. මිනිසාගේ ජිවිතය පදනම් කරගත්ත, ගැටළු සමුදාය පිළිබඳව එයින් විග්‍රහ වෙනවා. එම දුක අවබෝධ කරගැනීමේ හැකියාව ඇත්තේ තමන්ටමයි බුදුපියාණන් වහන්සේට කළ හැක්කේ ඒ සඳහා මග පෙන්වාදීම පමණකි.

මෙම සදාතගික දුක පිළිබඳව කථා කරන විටදී, බුදු දහම සර්ව අසුභ වාදියි කියලා ඇතමුන් වැරදි වැටහීමක පසුවෙනවා. බෞද්ධයන් වගේම අබෞද්ධයනුත්, ජිවීතය යනු මහ දුක් ගොඩක්ය. බුදු දහම තුළින් කථා කරන්නේම දුක ගැන පමණක්ය. එහි සැපක් හෝ සොඳුරු බවක් නැත. මහා අඳුරු දහමක්ය. මෙවැනි විවේචනද ඇතැම් විට ඉදිරිපත් වෙනවා. මෙසේ ඇතමෙක් විවිධ විවේචන ඉදිරිපත් කරන්නේ මෙම දුක්ඛ සංකල්පය හරි අයුරින් තේරුම් නොගත් අයය.

බුදුන් වහන්සේ දේශනා කළ මෙම දුක්ඛ සංකල්පය ගැඹුරු දාර්ශනික ඉගැන්වීමකි. එයින් කියවෙන්නේ ජිවීතයේ සදාතනික ගැටළුව එනම්, ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය කැමති දේ නොලැබීම, ප්‍රිය අයගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම යනාදි සියල්ල දුක බවයි.

අප විසින් ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් මගින්, ලබන්නාවු ආස්වාදයන්ගේ අවසානයක් නැත. සෑහීමකට පත්වන්නේද නැත. අතෘප්තිකරය. මෙම ඉඳුරන්ගේ ස්වභාවය නම් පිනවන්න, පිනවන්න ඇවිස්සී යාමයි. එහෙත් ඒවාට යම් සීමාවක් අවශ්‍යය. සීලා දී ගුණධර්ම තුළින් සිදු කරනු ලබන්නේ මෙම ඉන්ද්‍රියයන් හික්මවා ගැනීමයි. ශිෂ්ට සම්මත සමාජය තුළ ආචාර ධර්ම පද්ධතියක් පැවතිය යුතුය. නැතිනම්, එබඳු සමාජයක් පවතින්නේ නැත. ගිහි ජිවිතයක් ගත කරන පින්වතුන්ට, තෘප්තිමත්ව ජිවත්වීමේ අයිතිය බුදු දහමෙන් පෙන්වා දෙනවා.

ලෝකය තුළ ජිවත්වන සතුන් හා සියලු වස්තූන් ඇතිවෙනවා, පවතිනවා, නැති වී යනවා. අනිත්‍යයයි. මොහොතින් මොහොත වෙනස් වේ. ඒ නිසාම ඒ සියල්ල දුකකි. විවිධ අභියෝග, ගැටළු, දුක් කරදර නිසා අසරණ තත්ත්වයට අනාරක්ෂිත භාවයට පත්වීමද දුකකි. මෙලොව උපත ලබන සෑම කෙනෙක්ම ජරා, ව්‍යාධි, මරණාදී තත්ත්වයන්ට බඳුන්වීමත් ජිවිතයට ඉමහත් දුකකි.

මෙම දුක්ඛ සත්‍යය පැහැදිලි කිරීමේදී එම දුක් ලැයිස්තුවක් වශයෙන්, මෙසේ දක්වන්න පුළුවනි. ඉපදීම, මහළුවීම, ලෙඩවීම, මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, කැමති දේ නොලැබීම, පංච උපාදානස්කන්ධ දුක යනාදී සියල්ලම එයට ඇතුලත් වෙනවා. මෙම පංච උපාදානස්කන්ධය හැර අනිකුත් සියලු දුක් සිතීමෙන්, විමසීමෙන්, ඇසීමෙන්, කියවීමෙන් හා ඉගෙනීම තුළින් අවබෝධ කරගන්න පුළුවනි. විදර්ශනා වැඩීම තුළින් පංච උපාදානස්කන්ධ දුක අවබෝධ කරගැනීමට හැකිවේ.

අපි සියලු දෙනා සංකීර්ණ වු (ප්‍රශ්න, ගැටළු වලට මුහුණ දී ඇතැම් විටදී හෙම්බත් වී සිටින්නෙමු. මෙම දුක්ඛ සත්‍යය මනාව වටහා ගැනීමෙන්, අපේ ජිවිත සරලත්වයට පත්කර ගැනීමට පුළුවන් වේ. සසරදී මිනිසාට මුහුණ පාන්නට සිදුවන විවිධ දුක්ඛ දොමනස්සයන් ඉස්මතුකොට පෙන්වා දී ජිවිතය කලකිරවලා අසපුවලට, අරණය සේනාසනවලට යවන එක නොවෙයි මෙම දුක්ඛ සත්‍යය තුළින් අනාවරණය වන්නේ. තමන් ලැබු උතුම් ජිවිතයේ යථා ස්වභාවය තේරුම්කර යහපත් අර්ථ සම්පන්න ජිවිතයකට මඟ පෙන්වීමයි එයින් අපේක්ෂා කරනු ලබන්නේ.

මනුස්ස ජිවිතයේ අභියෝග වලට මුහුණ නොදී මානසික අසහනයන් ඇති කරවන, පවුල් අවුල් කරවන ජිවිතය කල කිරවන උදාසීනත්වයට පත්කරවන ඉගැන්වීමක් නොවේ මෙම පරම දුක්ඛ සත්‍යය. බුදුරජාණන් වහන්සේ වදාළ මධ්‍යම ප්‍රතිපදාවට අනුව එසේ සිතීම පවා වැරදිය.

බුදුන් වදාළ මේ උතුම් සද්ධර්මය පියවරෙන් පියවර අධ්‍යාත්මික වු නිර්වාණ මාර්ගයට යොමු කරවන දහමකි. යමකු නිවන් සුව ලබනවා යන්නෙන් හැඟෙන්නේ, ජිවිතයෙන් පලා යාමක් නොවේ.

මෙම දුක්ඛ ආර්ය සත්‍ය යනු මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම ආදී සියළු දෙනාටම මුහුණ පාන්නට සිද්ධවෙන ගැටළු සමුදායටය. බුදු කෙනෙක් ලොව පහළ වුනත් නැතත්, කවරෙක් පිළිගත්තත් නැතත් දුක්ඛ ආර්යසත්‍ය වෙනස් නොවී පවතී. බුද්ධ ධර්මය අනෙකුත් ආගම් හා විද්‍යාවන්ගෙන් වෙනස් වන්නේද මෙම උතුම් ආර්‍යය සත්‍ය පදනම් කරගෙනය. අපද අපගේ ජිවිතය තුළින් මෙම දුක්ඛ ආර්ය සත්‍ය අවබෝධ කරගැනීමට අධිෂ්ඨාන කරගනිමු.





